**ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය - 2023**

**-----------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලයේ ("මණ්ඩලය") 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාළ තොරතුරු ද ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 12 හි 12, 46, 58 හා 77 ඡේද ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා ආදායම් බදු ගණනය කර ගිණුම්ගත කර නොතිබුණි. | 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී නිවැරදි කරන බව. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව ආදායම් බදු ගණනය කර ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | සේවිකාවන් දෙදෙනෙකු විසින් මණ්ඩලයට එරෙහිව පවරන ලද නඩු දෙකක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 37 හි 84 අනුව හෙළිදරව් කර නොතිබුණි. | 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී හෙළිදරව් කරන බව. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව අසම්භාව්‍ය වගකීම් පිළිබඳ තොරතුරු හෙළිදරව් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනට වෙළඳ ණයගැති ශේෂය රු.16,229,979 ක් වූ අතර ඉන් වර්ෂ 3 ත් 12 ත් අතර පවතින රු.11,864,738 ක අයකර ගැනීමට නොහැකි ණයගැති ශේෂ සඳහා ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති අංක 9 හි 5.4.4 හා 5.5 ඡේද ප්‍රකාරව බොල්ණය ප්‍රතිපාදනය කිරීමට කටයුතු කර නොතිබුණි. | පද්ධතිය තුළ පැරණි ශේෂ නිසි ආකාරව ඇතුළත් නොකිරීම හා ණයගැතියන් අදාළ ඉන්වොයිස්පත් පියවා ඇතත් ශේෂයන් නිරවුල් කිරීමට අපොහොසත්වීම දක්වා ඇත. 2024 වර්ෂයේදී අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියට යටත්ව මෙම ශේෂ ඉවත්කිරීමට කටයුතු සලසා ඇති බව. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව බොල්ණය ප්‍රතිපාදනය කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2013 වර්ෂයේ දී ප්‍රාදේශීය සංවර්ධන බැංකුවෙන් ලබාගන්නා ලද රු.මිලියන 200 ක ණය මුදලින් රු.158,399,824 ක් සහ නොගෙවූ පොලිය සමුච්චිත වීමෙන් ප්‍රාග්ධනීත කරන ලද ණය පොලී ශේෂය රු.12,609,762 ක් 2023 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතුව පැවතුණු අතර මීට අදාළ රු.18,534,346 ක් වූ සමාලෝචිත වර්ෂයේ පොලිය ගිණුම්ගත කර නොතිබුණි. මේ හේතුවෙන් එම වටිනාකමින් ලාභය වැඩියෙන් හා ජංගම වගකීම් අඩුවෙන් දැක්වුණි. | ප්‍රාදේශීය සංවර්ධන බැංකුව සමඟ අමාත්‍යාංශය මැදිහත්වීමෙන් පවත්වන ලද සාකච්ඡා මත වර්ෂ කිහිපයක සහනදායි පොලී කපා හැරීමක් සහ විචල්‍ය වූ පොලී අනුපාත ඉවත්කිරීමට එකඟ විය. ඒ අනුව 2023 වර්ෂයට අදාළ පොලිය ගිණුම්ගත කිරීම හෝ නැවත ගෙවීම පිළිබඳව නිශ්චිත නැති බැවින් 2023 ගිණුම් තුළින් ඉවත් කරන ලද බව. | පොළිය කපා හැරීමට ලිඛිත එකඟතාවයක් නොමැති බැවින් ගෙවිය යුතු පොළිය නිවැරදිව ගිණුම් ගත කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ භෞතික තොග සත්‍යාපනයේදී හඳුනාගත් රු.6,804,182 ක තොග ඌණතාවය ගිණුම්ගත කිරීමට හා පාඩුව ආවරණය සඳහා විධිමත් ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබූ අතර එම වටිනාකමින් තොග ශේෂය හා වර්ෂයේ ලාභය වැඩියෙන් දැක්වුණි. | 2024 වර්ෂයේ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව ඉදිරිපත් කර අදාළ ගිණුම් කටයුතු 2024 වර්ෂයේ සිදුකිරීමට කටයුතු කරන බව. | තොග ඌණතාවය ගිණුම්ගත කිරීමට හා පාඩුව ආවරණය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | භෞතික තොග නිවැරදිව සත්‍යාපනය නොකිරීම හා තොග සම්බන්ධයෙන් ගිණුම්කරණ පද්ධතියේ පවතින නොසැසඳීම් හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් රු.196,543,310 ක් වූ තොගයේ පැවැත්ම විගණනයට තහවුරු කරගත නොහැකි විය. | භෞතිකව පවතින තොගයද සංසන්දනය කර 2024 වර්ෂයේ ගිණුම් තුළින් පෙර වර්ෂ ගැළපුම් යටතේ ගිණුම් ගත කිරීමට කටයුතු සලසා ඇති බව. | තොග නිවැරදිව භෞතික සත්‍යාපනය කර ගිණුම්ගත කළ යුතුය |
| (ඈ) | සමාලෝචිත වර්ෂය අවසානයට පිරියත හා යන්ත්‍ර සහ ලී බඩු සවිකිරීම් හා කාර්යාල උපකරණ වල ධාරණ අගය පිළිවෙලින් රු.2,206,496කින් සහ රු.4,362,015කින් ඉක්මවා ක්ෂය කර තිබීම හේතුවෙන් දේපළ පිරියත හා උපකරණ වටිනාකම හා ලාභය රු 6,568,511කින් අඩුවෙන් දක්වා තිබුණි. | 2024 වර්ෂයේ ගිණුම් තුළින් නිවැරදි කිරීමට කටයුතු කරන බව. | දේපළ පිරියත හා උපකරණ නිවැරදි වටිනාකම් ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | එකඟ වූ බදු ගිවිසුම් 3 ක් ක්‍රියාත්මක නොවීම නිසා ගිණුම්ගත කර තිබූ ගිවිසුම්ගත වටිනාකම් එකතුව රු.1,505,000 ක් ලැබිය යුතු ශේෂ තුල වැඩියෙන් දක්වා තිබුණි. | ගිවිසුම්ගත නොකරන ලද රු.1,505,000 ක වටිනාකමට අදාළව උපදෙස් අධ්‍යක්ෂ මණ්ඩලය මගින් ලබා ගැනීමට කටයුතු කරනු ඇති බව. | මූල්‍ය ප්‍රකාශන තුල ලැබිය යුතු ශේෂ නිවැරදිව ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.5.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු. | අනුරූපී වාර්තා අනුව වටිනාකම රු. | වෙනස රු. | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| දේපළ පිරියත හා උපකරණ | රු.220,031,513 | රු.64,369,755 | රු.155,661,758 | 2024 වර්ෂය තුල මෙම නිවැරදි කිරීම් සිදුකිරීමට කටයුතු කරන බව. | දේපළ පිරියත හා උපකරණ වල වෙනසට අදාළ සැසඳීම් කර අවශ්‍ය නිවැරදි කිරීම් සිදු කළ යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රේස් කෝස් ප්‍රදර්ශනාගාරය සඳහා 2012 වර්ෂයේ නාගරික සංවර්ධන අධිකාරිය වෙත ගෙවන ලද රු.3,701,025 ක තැන්පතු මුදල නැවත අය නොවන නමුත් ගිණුම්වල ලැබිය යුතු ලෙස දක්වා තිබුණි. | තැන්පතුව ආපසු නොගෙවන (Non Refundable) ලෙස ගිණුම්වල පෙන්වීමට 2024 වර්ෂය තුළ කටයුතු කරන බව. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | කෞතුකාගාර භූමියේ ස්ථාපිත කර තිබී 2023 නොවැම්බර් මස ඉවත් කරන ලද ලක්සල ප්‍රදර්ශනාගාරයේ ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් මණ්ඩලය දරන ලද වියදම් වෙනුවෙන් කෞතුකාගාර දෙපාර්තමේන්තුවෙන් රු.107,548,197 ක මුදලක් ලැබිය යුතුව පැවතුණද එය මේ දක්වා අයවී නොතිබුණි. | ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තු පරිශ්‍රයේ ගොඩනැගිල්ලක පවත්වාගෙන ගිය ලක්සල සමරු භාණ්ඩ අලෙවි සැල අමාත්‍ය මණ්ඩල තීරණයකට අනුව ඉවත් කරන ලදී.<br>එහිදී එම දෙපාර්තමේන්තුවට අයවිය යුතු හිඟ බදු කුලී හා විදුලි ගාස්තු සහ ලක්සල ආයතනය විසින් ගොඩනැගිල්ලේ සංවර්ධනයට ආයෝජනය කරන ලද මුදල් අතර ගැලපුම් කර මෙම මණ්ඩලයේ ගණනය කිරීම් අනුව රු.107,548,197 ක මුදලක් ලක්සල වෙත ලැබිය යුතුව පැවතුනද එම දෙපාර්තමේන්තුව දැනුම් දී මුදල පිළිගත නොහැකි හෙයින් මීළඟ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක් වෙත අදාළ තොරතුරු ඉදිරිපත් කර තීරණයක් ගැනීමට නියමිතව ඇති බව. | දරන ලද වියදම් නොපමාව ආපසු අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ගාල්ල උණවටුන සළුසල ආයතනයට අයත්ව තිබූ අක්කර 01 පර්චස් 30.6 ක භූමිය හා ගොඩනැගිලි 2012 ඔක්තෝබර් 11 දිනැති හා අංක 12/1523/553/020 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් මණ්ඩලය වෙත පවරා දී තිබූ අතර ගැනුම් ප්‍රතිෂ්ඨාව ලෙස සලකා මණ්ඩලය විසින් 2012 වර්ෂයේදී රු15,248,575 ක් ගෙවා තිබුණ ද ලංකා සළුසල ආයතනය මෙම ඉඩම නැවත 2023 සැප්තැම්බර් 22 දින රු.25,000,000 ක මුදලකට කාර්මික සංවර්ධන මණ්ඩලයට පවරා දී තිබුණි. එහිදී ආයතනය ගැනුම් ප්‍රතිෂ්ඨාව ලෙස ගෙවා තිබූ වටිනාකම සළුසල ආයතනයෙන් අයකර ගැනීමට 2024 සැප්තැම්බර් 25 වන දින වන විටත් කටයුතු කර නොතිබුණි. | සී/ස ලංකා සළුසල ආයතනය විසින් උක්ත දේපලට අදාලව නඩු කටයුත්තක් පවතින බව දක්වමින් මෙම මණ්ඩලය වෙත එම දේපළ නිසි පරිදි පැවරීම සිදුකර නොමැති අතර නඩු කටයුතු අවසන් වූ වහාම එම පැවරීම නීත්‍යානුකූල ඔප්පුවක් මගින් සිදු කරන බවට දැනුම් දී ඇත. ලංකා සළුසල වෙත ගෙවන ලද රු.15,248,575 ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය වෙත සෘජුවම ලබා දීමටත් උපදෙස් ලබා දෙන ලද බව. | මණ්ඩලය ගෙවන ලද මුදල් අයකර ගැනීමට නොපමාව කටයුතු කළ යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| **(අ)** | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ 21 හා 23 වගන්ති | 2015 නොවැම්බර් 19 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී ගත් තීරණය පරිදි නිලධාරිනියන් දෙදෙනෙකු වැඩ තහනමකට ලක් කර තිබුණද සමාලෝචිත වර්ෂයේදීද මණ්ඩලයේ විනය බලධරයා විසින් විනය නියෝග ලබා දී නොතිබුණි. | විනය පරීක්ෂණයේ අවසන් පරීක්ෂණ වාර්තාව සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙතෙක් තීරණයක් ගෙන නොමැත. එක් අයෙකුට අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් කොළඹ මහාධිකරණයේ නඩුවක් ගොණුකර ඇති අතර අනෙක් නිලධාරිනිය විසින් වත්තල කම්කරු අධිකරණයේ ගොණුකර ඇති නඩුවේ තීන්දුව ප්‍රකාරව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය යටතේ රු.6,294,099 ක මුදලක් පැමිණිලි පාර්ශවය වෙත ගෙවා ඇති බව. | ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ 21 හා 23 වගන්ති අනුව විනය පරීක්ෂණ තීරණය ප්‍රකාරව විනය නියෝග ලබාදිය යුතුය. |
| (ආ) i. | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | රු.444,346 ක් වටිනා මාස 6 ඉකුත් වූ නිකුත් කළ චෙක්පත් 27ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | 2023 වර්ෂයේ පද්ධතියේ ඇති වූ දෝෂ සහ නිරන්තර පද්ධති බිඳවැටීම හේතුවෙන් දත්ත යාවත්කාලීන කිරීමට නොහැකි වී ඇත. ඉදිරියේදී මෙවැනි තත්වයන් | මාස 6 ඉක්ම වූ චෙක්පත් සම්බන්ධව මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | මුදල් රෙගුලාසි 396 (ඇ) | | ඇති නොවීමට වගබලා ගැනීමට උපදෙස් ලබා දී ඇති බව. | |
| ii. | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය හා මුදල් රෙගුලාසි 371(5) | නිලධාරීන් 6 දෙනෙකු විසින් ලබාගෙන තිබූ රු.572,490 ක තත්කාර්යය අත්තිකාරම් දින 30 සිට දින 252 ත් අතර කාල ප්‍රමාදයක් සහිතව පියවා තිබූ අතර නිලධාරීන් 6 දෙනෙකු ලබාගෙන තිබූ රු.483,000 ක අත්තිකාරම් මුදල් ඊළඟ වර්ෂයේ පියවා තිබුණි. | නොපියවූ අත්තිකාරම් පියවා ගැනීමට හා නොපියවන ලද අත්තිකාරම් අදාල පාර්ශවයන්ගේ මාසික වේතනයෙන් අයකර ගැනීමට උපදෙස් දී ඇත. ඒ අනුව 2024 වර්ෂයේ ඉදිරියට ගෙනයාමට නොහැකි බව තරයේ අවධාරණය කරන ලද බව. | අත්තිකාරම් සම්බන්ධව මුදල් රෙගුලාසි 371(5) අනුව කටයුතු කළ යුතුය. |
| iii. | මුදල් රෙගුලාසි 502 (2) සහ 2009 සැප්තැම්බර් 01 දිනැති හා අංක DMA/2009(2) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය | ස්ථාවර වත්කම් ලේඛනයක් විධිමත්ව නඩත්තු කර නොතිබූ අතර වත්කම් වර්ග 04 කට අදාළව රු.178,345,544 ක මිලදීගැනීම් පිළිබඳ තොරතුරු නිවැරදිව යාවත්කාලීන කර නොතිබුණි. | වත්කම් ලේඛණයක් නඩත්තුකර පවත්වාගෙන යාමට ඉදිරියේ දී කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි අනුව ස්ථාවර වත්කම් ලේඛනය විධිමත්ව නඩත්තු කළ යුතුය. |
| (ඇ) | 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මඟින් හඳුන්වා දී ඇති රාජ්‍ය ව්‍යවසායන් සඳහා වන මෙහෙයුම් අත්පොතෙහි 6.6 ඡේදය | 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මාස 06 ක් ප්‍රමාද වී 2023 අගෝස්තු 5 දින විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණු අතර කෙටුම්පත් වාර්ෂික වාර්තාව මෙම වාර්තාවේ දිනය දක්වාම ලබා දීමට කටයුතු කර නොතිබුණි. | SAP ERP මෘදුකාංගය 2022 දෙසැම්බර් මස සිට 2023 මාර්තු මස දක්වා සම්පූර්ණයෙන් අක්‍රීය වීම හේතුවෙන් දත්ත නැවත ඇතුලත් කිරීමට විශාල පරිශ්‍රමයක් දැරීමට සිදුවිය. 2024 වර්ෂය තුළ දී නව පද්ධතියක් මණ්ඩලය තුල ස්ථාපිත කිරීමට කටයුතු සලසා ඇති බව. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව නියමිත දිනට ඉදිරිපත් කළ යුතුය. |
| (ඈ) | 2022 අංක 25 දරන සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනත | ස්ව තක්සේරු පදනම මත මාසිකව බදු මුදල් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ගෙවීම් කිරීමට කටයුතු නොකිරීම නිසා සමාලෝචිත වර්ෂය අවසානයට රු.6,590,693 ක් තවදුරටත් ගෙවිය යුතුව පැවතුණි. | මෙම හිඟ මුදල් ඉදිරියේ දී මාසිකව ගෙවීමෙන් බදු ගෙවීම යාවත්කාලීන කිරීමට බලාපොරොත්තු වන බව. | සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනත ප්‍රකාරව ගෙවීම් යාවත්කාලීනව සිදු කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.57,120,290 ක ලාභයක් වූ අතර ඊට ප්‍රතිරූපිව ඉකුත් වර්ෂයේ අලාභය රු.99,040,670 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.156,160,960 ක වර්ධනයක් නිරීක්ෂණය විය. විකුණුම් පිරිවැය රු. 132,218,213 කින් පරිපාලන වියදම් රු. 35,726,177 කින් හා විකුණුම් සහ බෙදාහැරීමේ වියදම් රු.38,359,101 කින් ඉහල ගොස් පැවතිය ද, මණ්ඩලයේ ආදායමෙහි ඇතිව තිබූ රු. 357,653,549 ක වැඩි වීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 වර්ෂයේ ඩුබායි රාජ්‍යයේ පැවති ග්ලෝබල් විලේජ් ප්‍රදර්ශනය සඳහා යවන ලද රු.20,731,487 ක් වටිනා අත්කම් නිර්මාණ සහ මැණික් හා ස්වර්ණාභරණ වලින් රු.7,200,424 ක් වටිනා මැණික් හා ස්වර්ණාභරණ භාණ්ඩ ආපසු එවා තිබුණද එම භාණ්ඩ වරලත් නියෝජිතයා විසින් නැවත මණ්ඩලය වෙත ලබා දී නොතිබුණි. අදාළ ප්‍රදර්ශන අලෙවි වටිනාකම වූ රු.13,531,064 කින් 2024 පෙබරවාරි 05 විගණන දින වන විටත් රු.2,706,213 ක මුදලක් මණ්ඩලයට ලැබී නොතිබුණි. | වරලත් අලෙවි නියෝජිත ගිවිසුමෙහි 5:3:2 වගන්තිය වරලත් අලෙවි ප්‍රදර්ශනාගාරයන්හී දෛනික අලෙවිය සඳහා පදනම් වුවද එය තාවකාලික අලෙවි ප්‍රදර්ශන සඳහා අදාල නොවන අතර ඒ සඳහා එකඟතා ලියවිල්ලක් මත ගණුදෙණු නිවැරදිව සිදු වී ඇති බව. | ඉතිරි මැණික් හා ස්වර්ණාභරණ තොග හා ලැබිය යුතු මුදල් නොපමාව අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | වර්ෂ ගණනාවක සිට පැවත එන ගෙවිය යුතු බදු (ආදායම් බදු, ආර්ථික සේවා බදු, ජාතිය ගොඩනැගීමේ බදු, එකතු කල අගය මත බදු) රු.46,125,572 ක් 2018 හා 2019 වර්ෂ වලට අදාලව ගෙවිය යුතු රඳවා ගැනීමේ බදු රු.1,494,183 ක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කර නොතිබුණි. තවද 2011 සිට 2022 දක්වා මණ්ඩලයේ විගණන කටයුතු වෙනුවෙන් ජාතික විගණන කාර්යාලයට ගෙවිය යුතු විගණන ගාස්තු රු.9,295,157 ක් සමාලෝචිත වර්ෂයේදී ද නිරවුල් කර නොතිබුණි. | 2009 වර්ෂය දක්වා මණ්ඩලය විසින් දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු බදු මුදල් පිළිබඳව දේශිය අදායම් දෙපාර්තමේන්තුව සමඟ එළඹී එකඟතාවයකට අනුව රු.1,144,609ක මුදල් ගෙවා ඇති බව. | ගෙවිය යුතු බදු මුදල් නොපමාව ගෙවීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 1991 ජුලි 05 දිනැති හා අංක 670 දරන ගැසට් පත්‍රය මඟින් ගාල්ල අලෙවි ප්‍රදර්ශනාගාරය පිහිටි ඉඩම සහ දෙමහල් ගොඩනැගිල්ල මණ්ඩලය වෙත පවරා දී තිබුණ ද නීත්‍යානුකූලව හිමිකම ලබා ගැනීමට සමාලෝචිත වර්ෂය දක්වාම කටයුතු කර නොතිබුණි. | දේපලවල නීත්‍යානුකූලව හිමිකම ලබා ගැනීමට කටයුතු කරමින් පවතින බව. | දේපලවල නීත්‍යානුකූල හිමිකම ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.2 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කිසිදු මෙහෙයුම් කටයුත්තක් සඳහා උපයෝජනය නොකර 2009 වර්ෂයේ සිට වසා දමා ඇති කෙසෙල්වත්ත ව්‍යාපෘතිය සතු රු.4,921,120 ක් වටිනා යන්ත්‍ර සූත්‍ර හා ගොඩනැගිලි නිශ්කාර්යව පැවතුණු අතර එහි ආරක්ෂාව සඳහාද වාර්ෂිකව රු.1,041,600 ක් වැය කරමින් පැවතුණි. | ඉදිරියේදී කෙසෙල්වත්ත පරිශ්‍රයේ සුදුසු ඵලදායී ව්‍යාපෘතියක් ස්ථාපනය කිරීමට කටයුතු කරන බව. | පවතින සම්පත් වලින් උපරිම ප්‍රයෝජන ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | කොටුව අලෙවි ප්‍රදර්ශනාගාර ගොඩනැගිල්ලෙහි වර්ග අඩි 40,830 ක් පමණ වූ පරිශ්‍රය අබලන් වීම හේතුවෙන් දීර්ඝ කාලයක සිට නිශ්කාර්යව පවතින අතර නවීකරණය කර භාවිතා කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී ප්‍රතිපාදන අවස්ථානුකූලව සපයා ගෙන මෙම ගොඩනැගිල්ල අත්‍යාවශ්‍ය සංවර්ධන කටයුතු කඩිනමින් සිදුකර අතිරේක ආදායමක් ඉපයීමට අපේක්ෂා කර ඇති බව. | පවතින සම්පත් වලින් උපරිම ප්‍රයෝජන ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |